*සැ. යු.* - 2018.07.26 දින පළ වූ අංක 2,082 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,083 - 2018 අගෝස්තු මස 03 වැනි සිකුරාදා - 2018.08.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1200 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥානත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*-(i) ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධනය) පනත් කෙටුම්පත 2018 ජූලි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 අගෝස්තු මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## හම්බන්තොට ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියැදුරු III වන ශ්‍රේණිය | 01 | PL3 - 2016 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06 ක් සමත් වී තිබීම සහ පුරප්පාඩුව පවතින මෝටර් රථ වර්ගයෙහි රියැදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය. මෝටර් රථ රියැදුරන් රියැදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. |
| 02 | විදුලි කාර්මික - III වන ශ්‍රේණිය | 01 | PL 2 - 2016 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් (06) ක් සමත් වී තිබීම සහ අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 03 | සෞඛ්‍ය කම්කරු - III වන ශ්‍රේණිය | 02 | PL 1-2016 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම. |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත අය විය යුතුය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.(දැනටමත් දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදළ නොවේ.)
5. බඳවා ගැනීමේ පටිපාටියට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහි දී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.
6. රියැදුරු තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම ඉල්ලුම්කරුවෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත අය විය යුතුය.
7. දැනටමත් හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක. කොන්ත්‍රාත් හෝ දෛනික පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.
8. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට ද, හම්බන්තොට ප්‍රාදේශීය සභාව පනවනු ලැබ ඇති හා වරින්වර පනවනු ලබන නීතිරීති වලට ද යටත් විය යුතුය.
9. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. මෙම සියලු තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
II. වැන්දඹු/පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
III. බඳවා ගනු ලබන අය වසර 03ක පරිවාස කාලයකට යටත් ය. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
IV. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

04. අයදුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය.

- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත
- අධ්‍යාපන සහතික, ඉහළම අධ්‍යාපන සුදුසුකම් දක්වෙන වෙනත් සහතික
- තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය
- මෑතක දී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක්
- සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
- වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික
  (මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.)

05. *අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් 2018.08.21 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "සභාපති, හම්බන්තොට ප්‍රාදේශීය සභාව, හම්බන්තොට" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සතුය.

ගාමිණී සමරගුණරත්න,
සභාපති,
හම්බන්තොට ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 16 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය සභාව,
හම්බන්තොට.

**ආදර්ශ අයදුම්පත්‍රය**

හම්බන්තොට ප්‍රාදේශීය සභාව

***..................................................... තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ නම (මුලකුරුසමග) :—————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :—————————.
3. ස්ථිර ලිපිනය :—————————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :—————————.
6. උපන්දිනය: වර්ෂය:——————, මාසය:—————— ; දිනය:—————— ;
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු:————— ; මාස:————— ; දින:————— ;

8. විවාහක/අවිවාහක බව :——————————.

9. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

10. ජාතිය :——————————.

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? (පරම්පරාවෙන් ද?/ලියාපදිංචි වීමෙන්ද) :——————————.

12. ඔබ සාපරාදී වරදක් සම්බන්ධව උසාවියකින් වරදකරුවකු කර තිබේද? :——————————.

13. දුරකථන අංකය :——————————.

14. අධ්‍යාපන සුදුසුකම් :

| අ.පො.ස. (සා/පෙළ) | අ.පො.ස. (උ/පෙළ) |
|---|---|
| ............................................ | ............................................ |
| ............................................ | ............................................ |
| ............................................ | ............................................ |
| ............................................ | ............................................ |
| ............................................ | |
| ............................................ | |
| ............................................ | |
| ............................................ | |

15. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————.

16. ඔබ දැනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම් :——————————.

(i) දැනට දරන තනතුර :—————————— ;

(ii) එම තනතුරට පත් වූ දිනය :—————————— ;

(iii) එම පත්වීමේ ස්වභාවය : (ස්ථිර/ආදේශක/අනියම්/කොන්ත්‍රාත්/දෛනික පදනම ද යන වග) :——————————

(iv) ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේද ? :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————.

අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

*දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ආයතනයේ ........................................................ලෙස සේවය කරනු ලබන ..................................................මයා/මිය/මෙය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු කාර්යාලීය ලිපි ලේඛන අනුව නිවැරදි වේ. මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක.

——————————.

ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :——————————.

තනතුර:——————————.

දිනය :——————————.

08-113

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ -තනතුරු පුරප්පාඩු

### බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාතේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු වී ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.08.17 වැනි දිනට හෝ එදිනට පෙර "ලේකම්" බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව, පානදුර පාර, බණ්ඩාරගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට සහ මෙම සභාවේ දැනට අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | වැටුප් ක්‍රමය | තනතුරු ගණන | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | පෙර පාසල් ගුරු | රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 600 - රු. 45,540 | 01 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, ඉංග්‍රීසි හා සිංහල/දෙමළ ඇතුළුව විෂයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.<br><br>සහ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br><br>පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳව මාස 06කට නොඅඩු කාලයක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. |
| 02 | සෞඛ්‍ය පරිපාලක | රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 600 - රු. 45,540 | 02 | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත් ව තිබීම සහ ;<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.<br><br>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා PL1 හා PL2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා සේවා කාලය වසර පහක් (05) සපුරා ඇති සේවකයින් නම් සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු අතර අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතුය. (මින් විෂයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතුය.) |

| අනු. අංකය | තනතුරු නාමය | වැටුප් ක්‍රමය | තනතුරු ගණන | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 03 | බර යන්ත්‍ර ක්‍රියාකරු | රු. 25,250 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12x350 - රු. 38,450 | 01 | අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත් ව තිබිය යුතුය.<br>සහ<br>**වෘත්තීය සුදුසුකම් :**<br>බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය. අවම උස අඩි 05ක් විය යුතුය.<br>බර යන්ත්‍ර/ගල්රෝල් ක්‍රියා කරවීම පිළිබඳව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 04 මට්ටමට අදළ සහතිකයක් තිබිය යුතුය. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය.<br>**පළපුරුද්ද**<br>බර යන්ත්‍රෝපකරණ/ගල්රෝල් ක්‍රියා කරවීම පිළිබඳව එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම. |
| 04 | විදුලි කම්බිකරු | රු. 25,250 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12x350 - රු. 38,450 | 01 | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයන් 06ක් සමත්වී තිබීම. (මින් විෂයන් 05ක් එකවර සමත් විය යුතුය.)<br>සහ<br>අදළ තනතුරට නියමිත පරිදි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම හා අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.) |
| 05 | ආදාහනාගාර ක්‍රියාකරු | රු. 25,250 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12x350 - රු. 38,450 | 01 | අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත්ව තිබිය යුතුය. (තනතුරට අදාළව වසර 02ක පළපුරුද්දක් තිබිය යුතුය. සහතික මගින් සනාථ කළ යුතුය.) |
| 06 | පෙර පාසල් සහායක | රු. 24,250 - 10 x 250 -10 x 270 - 10 x 300 - 12x330 - රු. 36,410 | 04 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් 06ක් සමත් වී තිබීම. (මින් විෂයන් 05ක් එකවර සමත් විය යුතුය.) |
| 07 | ආදහනාගාර ක්‍රියාකරු සහායක | රු. 24,250 - 10 x 250 -10 x 270 - 10 x 300 - 12x330 - රු. 36,410 | 01 | අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත්ව තිබිය යුතුය. |
| 08 | සෞඛ්‍ය කම්කරු | රු. 24,250 - 10 x 250 -10 x 270 - 10 x 300 - 12x330 - රු. 36,410 | 06 | අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත්ව තිබිය යුතුය. |

ඉහත සඳහන් කරන ලද තනතුර සඳහා අදාළ සුදුසුකම් වලට අමතරව පහත දැක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතුය:

1. *පොදු සුදුසුකම් :*

I. අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වර්ෂ 03ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. (බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් සහතික කරනු ලබන ග්‍රාම නිලධාරී සහතිකයකින් සනාථ විය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2018.08.17 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

III. අයදුම්කරු යහපත්/විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

IV. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

V. අයදුම්කරු පරම්පරාවෙන් ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

VI. ඉල්ලුම්පත් භාරගැනීමේ අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නොමැත්තා වූ ද, සතුටුදයක සේවා කාලයක් සපුරනු අයකු විය යුතුය.

VII. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයකින් තනතුරු සඳහා අයදුම් කිරීමේ දී රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුය.

2. *සේවය නියුක්ත කිරීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

II. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන්නේය./ශ්‍රේණිගත උසස් වීමක් නම් අවුරුදු 1 ක වැඩ පරීක්ෂක කාල සීමාවකට යටත් විය යුතුය.

III. ඉහත තනතුරු යටතේ බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

IV. මෙම සේවයේ සේවකයින් ස්ථාන මාරු කිරීම්වලට යටත් වේ. පළාත් පාලන ආයතන වල ස්ථාන මාරු කිරීමේ බලය ඒ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රධානියා සතු වේ. තවද, පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම් ඒ ඒ පළාත් පාලන ආයතන ප්‍රධානියා රජය පිළිගත් නීති රීති වලට යටත්ව තීරණය කළ හැකි වේ.

V. මෙම බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලටද රජය හෝ පළාත් සභාවේ හෝ දෙපාර්තමේන්තු නියෝගවලටද, වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද, අනුකූලවය. ඒ අනුව ක්‍රියා කිරීමට පත්වීම් ලාභීන් බැඳී සිටිය යුතුය.

3. *බඳවා ගැනීමේ ක්‍රමය :*

I. බඳවා ගැනීමේ පටිපාටිය අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයක ප්‍රතිඵල මත හෝ අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයක කුසලතාවය මත සුදුසුකම් ලබන අයව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් සුදුස්සන් තෝරා ගැනේ.

II. බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් නොමැති තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

4. *අයදුම් කිරීමේ ක්‍රමය :*

I. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික පත්‍රවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය. මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය ;
(2) ජාතික හැඳුනුම්පතේ පිටපත ;
(3) මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි ;
(4) වෘත්තීය හෝ පළපුරුද්ද සනාථ කෙරෙන ලියවිලි ;
(5) තම පදිංචිය සනාථ කිරීම පිණිස මෑතකදී ලබා ගත් ග්‍රාමසේවා සහතිකය.

II. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

III. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ බඳවා ගැනීමට නියමිත තනතුරු සංඛ්‍යාව සංශෝධනය/තීරණය කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

IV. පෙර පාසැල් පාලිකා තනතුර සහ සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ප්‍රමුඛතා ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ලක්කර සුදුසුකම් පරීක්ෂා කෙරේ.

(*ආ*) ක්ෂේත්‍රයට අදළ කරුණු පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම පැය 02ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

V. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්පත් යොමු කරන තනතුර, *ගැසට් නිවේදනයේ* සඳහන් පරිදි පැහැදිලිව සටහන් කළ යුතුය. අසම්පූර්ණ හා 04 ඡේදය යටතේ සඳහන් සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එන්. ඩී. අයි. එස්. කේ. පෙරේරා,
ලේකම්,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 11 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව,
පානදුර පාර,
බණ්ඩාරගම.

**ආදර්ශ අයදුම්පත්‍රය**

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

**...............................................................................තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :———————————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :———————————.

03. ස්ථිර ලිපිනය :———————————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :———————————.

05. උපන් දිනය : වර්ෂය:—————. මාසය:—————. දිනය:—————.

06. අයදුම්පත් භාරගන්නා 2018.08.17 වැනි දිනට වයස : අවු.:————— මාස :————— දින :—————

07. ස්ත්‍රී පුරුෂ භාවය :———————————.

08. විවාහක/අවිවාහක බව :———————————.

09. ජාතිය :———————————.

10. ඔබ දැනටමත් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :.........................................................
දරන තනතුර, සේවා කාලය, එම පත් වීම ස්ථිර ද/තාවකාලික ද/අනියම් ද/කොන්ත්‍රාත් ද යන වග :..........................

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන්ද යන වග :

12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය) :

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :

.............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන ..................................................................මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) පදනම මත ....................................................කු වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම්කරන තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමකට හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

.....................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————
තනතුර :————————
දෙපාර්තමේන්තුව :————————

නිලමුද්‍රාව
දිනය :————————

08-142

---

## කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

කිරින්ද-පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | රියදුරු III වන ශ්‍රේණිය | 01 | PL3 - 2016<br>රු. 25,790 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12x350 - රු. 38,990<br>(රා.ප.චි. 3/2016 අනුව) | 01. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06 ක් සමත් වී තිබීම,<br>02. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් (බර වාහන ඇතුළත්ව) ලබා තිබීම.<br>03. රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. |
| 02. | වැඩ ක්ෂේත්‍ර කම්කරු - III වන ශ්‍රේණිය | 02 | PL1 - 2016<br>රු. 24,250 - 10 x 250 -10 x 270 - 10 x 300 - 12x330 - රු. 36,410<br>(රා.ප.චි. 3/2016 අනුව) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම. |
| 03. | සෞඛ්‍ය කම්කරු - III වන ශ්‍රේණිය | 02 | PL 1-2016<br>රු. 24,250 - 10 x 250 -10 x 270 - 10 x 300 - 12x330 - රු. 36,410<br>(රා.ප.චි. 3/2016 අනුව) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම. |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත අය විය යුතුය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.(දැනටමත් දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
5. බඳවා ගැනීමේ පටිපාටියට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහි දී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.
6. රියදුරු තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම ඉල්ලුම්කරුවෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත අය විය යුතුය.
7. දැනටමත් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක. කොන්ත්‍රාත් හෝ දෛනික පදනම යටතේ සේවයේ නියුතු වූවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් කෙරෙහි ද වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
8. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලටද, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටද, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව පනවනු ලැබ ඇති හා වරින් වර පනවනු ලබන නීතිරීති වලටද යටත් විය යුතුය.
9. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. මෙම සියලු තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
II. වැන්දඹු/පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
III. බඳවා ගනු ලබන අය වසර 03ක පරිවාස කාලයකට යටත් ය. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
IV. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

04. රියදුරු තනතුරට බඳවා ගැනීම සඳහා වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය :

| | | | |
|---|---|---|---|
| * | අ.පො.ස. සා/පෙළ සාමාර්ථය සඳහා ( 8x1) | = | 8 |
| * | අ.පො.ස. සා/පෙළ සම්මාන සාමාර්ථය සඳහා ( 8x2) | = | 16 (උපරිම) |
| * | අ.පො.ස. උ/පෙළ සමත් වීම | = | 04 |
| * | වෘත්තියට අදාළ දැනුම | = | 10 |
| * | පෞරුෂත්වය | = | 05 |
| * | වෘත්තියට අදාළව පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම (වසරකට ලකුණු 02 බැගින්) | = | 15 |
| | මුළු එකතුව | = | 50 |

සමත් වීම සඳහා 40% (ලකුණු 20) ක් හෝ ඊට වඩා ලකුණු ලබාගත යුතුය.

* වෘත්තියට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය සඳහා මුළු ලකුණු = 50
සමත් වීම සඳහා 40% (ලකුණු 20) ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගත යුතුය.

05. අනෙකුත් තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් ඃ

| | | | |
|---|---|---|---|
| * | අධ්‍යාපන සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | = 30 |
| * | අමතර සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | = 10 |
| * | පළපුරුද්ද | උපරිම ලකුණු ප්‍රමාණය | = 10 |
| * | සභා බල ප්‍රදේශයේ පදිංචිය (වසරකට ලකුණු 5 බැගින්) | උපරිම ලකුණු ප්‍රමාණය | = 45 |
| * | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | උපරිම ලකුණු ප්‍රමාණය | = 05 |
| | එකතුව | | = 100 |

(තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය 50%)

06. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය.

- * උප්පැන්න සහතිකය
- * ජාතික හැඳුනුම්පත
- * අධ්‍යාපන සහතික, ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික
- * තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය
- * මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක්
- * සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
- * රියදුරු තනතුර සඳහා අයදුම් කරන්නන් මෝටර් රථ පැදවීමේ බලපත්‍රයෙහි ඡායා පිටපතක්
- * වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික

(මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.)

07. *අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය ඃ*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් 2018.08.31 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "සභාපති, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව, කිරින්ද පුහුල්වැල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. අතින් ගෙනැවිත් භාරදෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර තුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සතුය.

සනත් හෙට්ටිආරච්චි
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 19 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව,
කිරින්ද පුහුල්වැල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

**...................................................... තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය**

1. මුලකුරු සමග නම :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.

3. ස්ථිර ලිපිනය :————————————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.
6. උපන්දිනය: වර්ෂය:——————— මාසය:——————— දිනය:———————
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු:——————— මාස:——————— දින:———————
8. විවාහක/අවිවාහක බව :————————————.
9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? යන වග :————————————.
10. ඔබ සාපරාධී වරදක් සම්බන්ධව උසාවියකින් වරදකරුවකු කර තිබේද? :————————————.
11. දුරකථන අංකය :————————————.

12. අධ්‍යාපන සුදුසුකම් :

| අ.පො.ස. (සා/පෙළ) | අ.පො.ස. (උ/පෙළ) |
|---|---|
| ............................................ | ............................................ |
| ............................................ | ............................................ |
| ............................................ | ............................................ |
| ............................................ | ............................................ |
| ............................................ | |
| ............................................ | |
| ............................................ | |
| ............................................ | |

13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

14. ඔබ දැනට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම් :................................

   1. දැනට දරන තනතුර :————————————.
   2. එම තනතුරට පත් වූ දිනය :————————————.
   3. එම පත්වීමේ ස්වභාවය : (ස්ථිර/ආදේශක/අනියම්/කොන්ත්‍රාත්/දෛනික පදනම ද යන වග) :————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

————————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ආයතනයේ .....................................................ලෙස සේවය කරනු ලබන ................................................මයා/මිය/මෙය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු කාර්යාලයීය ලිපි ලේඛන අනුව නිවැරදි වේ. මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන :————————————.
නම :————————————.
තනතුර:————————————.

දිනය :————————————.

08-223

## අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාතේ, රාජ්‍ය සේවයේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු වලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල සහායක III | 02 | රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410 PL 1 2016 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.<br>මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය. |
| 02 | සෞඛ්‍ය කම්කරු III | 03 | රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410 PL 1 2016 | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබිය යුතුය. |
| 03 | වැඩ/ ක්ෂේත්‍ර කම්කරු III | 02 | රු. 24,250-10x250-10x270-10x300-12x330-36,410 PL 1 2016 | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබිය යුතුය. |
| 04 | කාර්යාල කාර්ය සහායක III | 01 | රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410 PL 1 2016 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.<br>මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය. |
| 05 | මුරකරු | 03 | රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410 PL 1 2016 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.<br>මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය. |
| 06 | රියදුරු | 01 | රු. 25,790-10x270-10x300-10x330-350x12-රු. 38,990 PL 3 2016 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ 02ක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත් වී තිබිය යුතුය)<br><br>වෘත්තීය සුදුසුකම් :<br>පෞද්ගලික/ කුලී රථ සහ භාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන්වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.<br><br>(බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රව අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය)<br><br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.<br><br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබීම. |

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි .-*

1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
2. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන්නේය.
3. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝග වලටද, රජයේ හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසි වලටද අනුකූලව ක්‍රියාකිරීමට සියළුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීම සඳහා පොදු තොරතුරු .-*

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න අවුරුදු 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
3. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවකු හෝ රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.
6. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම .-*

1. විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
2. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව පිළියෙල කර ගන්නා අයදුම්පත් 2018.08.24 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව, මීගමු පාර, නිට්ටඹුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
3. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතුය.
4. තනතුරු කිහිපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් නම වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.
5. අයදුම්පත සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතුය.

   - උප්පැන්න සහතිකය
   - අධ්‍යාපන සහතික
   - පදිංචිය තහවුරු කිරීම පිණිස මාස 03ක් ඇතුළත ලබාගත් පදිංචිවීමේ සහතිකය
   - මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතුය)

6. නියමිත දිනට පසු වී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අතරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනත් වෙනස් කිරීම් හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේදී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඩී. අජිත් රණසිංහ,<br>
ලේකම් (වැ.බ.),<br>
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 19 වැනි දින,<br>
අත්තනගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත

**අත්තනගල්ල ප්‍රාදේශීය සභාව - නිට්ටඹුව**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ............................................ තනතුර සඳහා බඳවා ගැනීම*

(1) (අ) මුලකුරු සමඟ නම :———————————.

(2) (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :———————————.

(3) ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කය :———————————.

(4) ස්ථිර ලිපිනය :———————————.

(5) ජා. හැ. ප. අංකය :———————————.

(6) ස්ත්‍රී/පුරුෂ භාවය :———————. විවාහක/ අවිවාහක බව :———————.

(7) උපන් දිනය : අවුරුද්ද :————— මාසය :————— දිනය

2018.08.24 දිනට වයස : අවුරුදු :————— මාස :————— දින :—————

(8) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද/ ලියාපදිංචියෙන් ද යන වග :———————————.

(9) අධ්‍යාපන සුදුසුකම් :

i. සමත් වූ වසර/ ශ්‍රේණිය :—————

ii. අ.පො.ස. (සා/පෙ.) විභාගය - විභාග අංකය :————— වර්ෂය :————— මාසය :—————

සමත් වූ විෂයයන්

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| (i) | ............................................ | ...................... |
| (ii) | ............................................ | ...................... |
| (iii) | ............................................ | ...................... |
| (iv) | ............................................ | ...................... |
| (v) | ............................................ | ...................... |
| (vi) | ............................................ | ...................... |
| (vii) | ............................................ | ...................... |
| (viii) | ............................................ | ...................... |
| (ix) | ............................................ | ...................... |
| (x) | ............................................ | ...................... |

10) වෘත්තීයමය සුදුසුකම් : (සහතික මඟින් සනාථ කළ යුතු ය.)
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

11) සේවා පළපුරුද්ද : ...........................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

12) ඔබ කෙදිනක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ................................................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර මා නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසුව ඒ බව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

............................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :......................................

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ඃ

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ................................. මයා/ මිය/ මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ................................වශයෙන් සේවය කරයි. ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි ය/ නොහැකි ය. ඔහු/ ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

නම :————————————.
පදවි නාමය :————————————.
දෙපාර්තමේන්තුව/ ආයතනය :————————————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය :————————————.

.................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

08-182

---

**දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව**

තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමානය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 03 | PL-01-2016 | රා.ප.ච. 3/2016 අනුව<br><br>රු. 24250-250x10-270x10-300x10-330x12-රු. 36410<br><br>III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 8 වන ශ්‍රේණිය 9 වසර සමත්ව තිබිය යුතු ය.<br><br>**කායික සුදුසුකම්**<br>තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. |
| 02 | මුරකරු | 01 | PL-01-2016 | රා.ප.ච. 3/2016 අනුව<br>රු. 24,250-250x10-270x10-300x10- 330x12-රු. 36410<br><br>III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | **අධ්‍යාපන සුදුසුකම්**<br>අ.පො.ස.(සා.පෙ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙන් සම්මාන 02 ක් සහිතව විෂයන් හය (06) ක් සමත් විය යුතුය. (මින් විෂයන් පහක් (05) එකවර සමත් විය යුතු ය.)<br><br>**කායික සුදුසුකම්**<br>තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. |

01. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

I අයදුම්පත්‍ර බාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ හෝ පළාත් පාලන රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ).

II අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකුව විය යුතුය.

III අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

IV යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

V තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය* .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සිදු කරනු ලැබේ. විෂය නිර්දේශය හා ලබා දෙන ලකුණු පහත පරිදි වේ.

*මුරකරු :*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම | 20 | 50 |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

*වැඩ ක්ෂේත්‍ර කම්කරු :*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50 |
| තනතුරට අදාළව ලබා ඇති පලපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(I) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(II) වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ද දායක විය යුතුය.

(III) පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් වන්නේය.

(IV) මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද, රජය හෝ බස්නාහිර පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලටද අනුකූලය. ඒ අනුව ක්‍රියා කිරීමට සියළුම සේවකයින් බැඳී සිටිය යුතු වේ.

04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් සහතික වල ඡායා පිටපත් සමග 2018.08.28 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්" දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව, දොඩන්ගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත
- අධ්‍යාපන සහතික, ඉහළම අධ්‍යාපන සුදුසුකම් දක්වෙන වෙනත් සහතික
- තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය
- මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික 02 ක්
  (එක් චරිත සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබා ගත යුතුය. එය ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතුය)
- වෘත්තීය පලපුරුද්ද හා වෙනත් සුදුසුකම් දක්වෙන සහතික
- දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තැපෑලේ දී නැති වන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවූ අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලැබෙන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

පී. ජී. පී. රුද්‍රිගෝ,
ලේකම්,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දොඩන්ගොඩ.

2018 ජූලි මස 18 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දොඩන්ගොඩ.

**ආදර්ශ අයදුම් පත්‍රය**

බස්නාහිර පළාතේ රාජ්‍ය සේවයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ

....................................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :.........................................................................
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් ෑ .........................................................................
03. ස්ථිර ලිපිනය :.........................................................................
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.........................................................................
05. ජාතික හැඳුනුම්පත් අංකය :.........................................................................
06. දුරකථන අංකය :.........................................................................
07. උපන් දිනයඃ වර්ෂය :........................... මාසය :..................... දිනය :....................
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයසෘ ................................................................
අවුරුදුඃ.............. මාස :............ දිනඃ ........
09. විවාහක / අවිවාහක බව :...................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? යන වග : ..............................................

අධ්‍යාපන සුදුසුකම් : ..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

වෙනත් සුදුසුකම් :..........................................................................................................................................

11. මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මීට පෙර මා රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවකු හෝ සේවය අතහැර ගිය අයකු හෝ සාපරාදී වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් මගින් වරදකරුවකු වී නොමැති අයකු බවත් මා ඉහත තනතුර සඳහා තෝරා පත්කර ගැනීමට පෙර හෝ පසුව ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට හෝ දඬුවම් ලැබීමට යටත් බවත් දනිමි.

............................................;

දිනය :.................................. අයදුම්කරුගේ අත්සන.

12. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකු නම්) දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියා ලවා මෙම කොටස සම්පූර්ණ කරවා ගන්න.

ඉහත අයදුම්කරුවන ................................................................. මහතා / මිය / මෙනෙවිය මෙම ආයතනයේ ........................................ ................ වශයෙන් ................................................ දින සිට කටයුතු කරනු ලබයි. ඇයගේ / ඔහුගේ පත්වීම ............................... දින සිට ස්ථිර කර ඇත. අයදුම්කරු මීට පෙර විනයානුකූලව දඬුවම් ලබා ඇති / නැති අතර ඇයට / ඔහුට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමක් මේ වන විට සිදු කරමින් / නොකරමින් නොපවතී. මෙම තනතුරට තෝරා පත් කරනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් මුදා හැරිය හැකිය / නොහැකිය. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

. ...........................................;

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ /
ආයතනික ප්‍රධානියාගේ
අත්සන.

දිනය :.................................. .

13. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකු නම්) මෙම කොටස සම්පූර්ණ කරන්න.

1. දැනට දරන තනතුර :..........................................................................................................................

I. එම තනතුරට පත් වූ දිනය :..........................................................................................................................
වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය

08-127

# පළාත් පාලන නිවේදන

## මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ උතුරු මැද පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1960/35 හා 2016.03.30 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද සහ අංක 2022/32 දරන හා 2017.06.09 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* උතුරුමැද පළාත් සභාවේ ස්ථිරත්වය නිවේදනය කරන ලද පහත උපලේඛනයේ සඳහන් කෙටුම්පත් සංශෝධන අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමටත් මැදිරිගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත් 2018.05.25 වැනි දින පැවති මහා සභාවේ යෝජනා අංක 54 යටතේ තීරණය කරන ලද බව නිවේදනය කරමි.

එම්. ජී. යූ. එස්. කේ. වික්‍රමාරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මැදිරිගිරිය

උපලේඛනය

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බත් කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
2. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙනයාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
3. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු ක්‍රීඩා භූමි විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
5. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
6. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
7. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
8. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
9. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

08-144

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018** | | | |
| **අගෝස්තු** | 2018.08.03 | සිකුරාදා | 2018.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.10 | සිකුරාදා | 2018.07.26 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2018.08.17 | සිකුරාදා | 2018.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.24 | සිකුරාදා | 2018.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.31 | සිකුරාදා | 2018.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2018.09.07 | සිකුරාදා | 2018.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.14 | සිකුරාදා | 2018.08.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.21 | සිකුරාදා | 2018.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.28 | සිකුරාදා | 2018.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2018.10.05 | සිකුරාදා | 2018.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.12 | සිකුරාදා | 2018.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.19 | සිකුරාදා | 2018.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.26 | සිකුරාදා | 2018.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.